**අධ්‍යාපන අංශ සංවර්ධන වැඩසටහන මධ්‍යම විසර්ජන ගිණුම් තුන - 2015**

------------------------------------------------------------------------------------------

අධ්‍යාපන අංශ සංවර්ධන වැඩසටහනේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2013 අගෝස්තු 19 දින එළඹි අංක 3008 එස්ආර්අයි සාමාන්‍ය මෙහෙයුම් හා අංක 3009 එස්ආර්අයි විශේෂ මෙහෙයුම් ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවෙහි 4.04 වගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ණය ගිවිසුම් අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය, විභාග දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වැඩසටහනේ කටයුතු ජාතික මට්ටමෙන්ද, පළාත් සහා මඟින් පළාත් මට්ටමෙන්ද කරගෙන යාමට අපේක්ෂිතය. මෙම වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශය, විභාග දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් ජාතික මට්ටමෙන් කරන ලද කාර්යයන් පිළිබඳ අදහස් දැක්වීම්වලින් සමන්විතය.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

------------------------------------------------------------------------------------------

ණය ගිවිසුම්වලට අනුව, රටේ සාමාන්‍ය අධ්‍යාපන අංශය මුහුණපාන අභියෝග භාර ගැනෙන 2013-2017 අධ්‍යාපන අංශ සංවර්ධන රාමුව සහ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍යමය සහය ලබාදීම සඳහා අධ්‍යාපන අංශ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. අධ්‍යාපන අමාත්‍යාංශය අධ්‍යාපන අංශ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශය වැඩිදියුණු කිරීම, ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම හා අධ්‍යාපන කටයුතු පාලනය හා සේවා සැපයුම් ශක්තිමත් කිරීම වැඩසටහනේ අරමුණු වේ. ණය ගිවිසුම්වලට අනුව, වැඩසටහන සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 200 ක් වේ. වැඩසටහනේ කටයුතු 2013 අගෝස්තු 23 දින ආරම්භ කරන ලද අතර 2018 අගෝස්තු 31 වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------------------------------------

මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු

කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන් කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසනීයත්වය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ දක්වා ඇති වියදම් වැඩසටහන විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද අධ්‍යාපන අංශයෙහි මධ්‍යගත ආයතන තුනෙහි වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ අධ්‍යාපන අංශයේ මධ්‍යගත ආයතන තුනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) මුදල් රෙගුලාසි 150 හා මහා භාණ්ඩාගාරයේ 2015 දෙසැම්බර් 10 දිනැති අංක 245/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කර තිබුණේද යන බව.

(උ) ආසියානු සංවර්ධන බැංකුව සඳහා පිළිගත හැකි ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කර තිබුණේද යන බව,

(ඌ) තැන්පතු ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම්, මහා භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(එ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

-------------------

**2.1 විගණන මතය**

----------------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 150 සහ 2015 දෙසැම්බර් 10 දිනැති අංක 245/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල වන පරිදි 2014 අංක 41 දරන විසර්ජන පනතේ පළමු උප ලේඛනයේ ශීර්ෂ අංක 126 දරන අධ්‍යාපන අමාත්‍යාංශයට අදාළ 2015 වර්ෂය සඳහා විසර්ජන ගිණුම පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබූ බව, ඉහත ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව භාණ්ඩාගාරයේ පරිගණක මුද්‍රිත සටහන් සහ වාර්ෂික ඇස්තමේන්තු සහ අධ්‍යාපන අංශයේ මධ්‍යම ආයතන තුන විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තා සමඟ එකඟ වූ බව,

(ආ) තැන්පතු ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් මහා භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

-------------------------------------

**3.1 අරමුදල් උපයෝජනය**

--------------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ප්‍රධාන නියෝජිතායතනය | 200 | 26,000 | 5,144 | 33.72 | 4,822 | 55.33 | 7,913 |
| | **200** | **26,000** | **5,144** | **33.72** | **4,822** | **55.33** | **7,913** |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. මිලියන 26,000 කට සමාන එජඩො මිලියන 200 ක මුළු වෙන් කිරීමෙන් රු. මිලියන 7,913 කට සමාන එජඩො මිලියන 55.33 ක් හෙවත් සියයට 30.43 ක් වැඩසටහනේ මෙහෙයුම් ආරම්භ කර වසර 02 ක් ඉකුත්වීමෙන් පසුව උපයෝජනය කර තිබුණි.

(ආ) මහින්දෝදය තාක්ෂණික පීඨ සඳහා ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් සිදු කළ මුළු වෙන් කිරීම්වලින්, පාසැල්වල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක කළ "සනීපාරක්ෂාව පෙරට පළමු ජාතික වැඩසටහන" සඳහා රු. මිලියන 657 ක් භාවිතා කර තිබුණි.

(ඇ) තාක්ෂණික පීඨ ගොඩනැගිලි අළුත්වැඩියාව සඳහා 2015 වර්ෂය වෙනුවෙන් රු. මිලියන 50 ක් වෙන්කර තිබුණද, ඒ වෙනුවෙන් සකස් කළ භෞතික සැලසුම් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. මුළු වෙන්කිරීමෙන්, සමාලෝචිත වර්ෂය තුළදී අදාළ කාර්යයන් සඳහා රු.මිලියන 19.63 ක් පමණක් උපයෝජනය කර තිබුණි. කෙසේ වෙතත්, අදාළ අළුත්වැඩියා කටයුතුවල භෞතික ප්‍රගතිය සම්බන්ධයෙන් තොරතුරුද විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

රටේ පොදු අධ්‍යාපන අංශය මුහුණදෙන අභියෝග භාර ගැනෙන 2013-2017 අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන අනුව, වියපැහැදම් කිරීම් හා සබැඳි ප්‍රතිඵල හා ඒ සම්බන්ධ දර්ශක 09 ක් යටතේ ලඟාකරගත යුතු ඉලක්ක හඳුනා ගනු ලැබේ. 2015 වර්ෂය තුළදී ලඟා කර ගැනීමට අපේක්ෂිත වියපැහැදම් හා සබැඳි ප්‍රතිඵල පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වියපැහැදම් කිරීම් හා සබැඳි දර්ශක -07 අනුව, පාසැල් විදුහල්පතිවරු 343 ක් හා නියෝජ්‍ය විදුහල්පතිවරු 593 ක් 2015 දෙසැම්බර් 31 දිනට පුහුණු කර තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ජාතික පාසැල් 155 ක විදුහල්පති තනතුරු 2015 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවති අතර එයින් පාසැල් 49 ක විදුහල්පති තනතුරු 2009 වර්ෂයේ සිටම පුරප්පාඩුව පැවතුණි.

(ආ) මහින්දෝදය තාක්ෂණික පීඨ ඇතුළු සියලු පහසුකම් ලබා දී තිබුණද බදුල්ල, යාපනය හා වවුනියා දිස්ත්‍රික්කවල පිළිවෙලින් පස්සර දෙමළ මහ විද්‍යාලය, ඔඩ්ඩුසුඩාන් මහ විද්‍යාලය හා වවුනියා මහ විද්‍යාලවල ආරම්භ කළ ඉංජිනේරු තාක්ෂණික විෂය ධාරාව සඳහා වූ පන්තිවලට හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කන්තලේ මධ්‍ය මහ විද්‍යාලයෙහි ජීව තාක්ෂණික විද්‍යා විෂය ධාරාව සඳහා පන්තිවලට එක් සිසුවෙක් හෝ ඇතුළත්කර නොතිබුණි.

(ඇ) ඉදිරිපත් කළ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළදී තාක්ෂණික විෂය ධාරාව සඳහා සිසුන් 42,514 ක් සහ විද්‍යා හා ගණිත විෂය ධාරාව සඳහා සිසුන් 118,901 ක් බඳවා ගෙන තිබූ අතර පෙර වර්ෂයේ තාක්ෂණික විෂය ධාරාව සඳහා සිසුන් 28,985 ක් හා විද්‍යා හා ගණිත විෂය ධාරාව සඳහා සිසුන් 118,550 ක් බඳවා ගෙන තිබුණි. තවද, 2014 වර්ෂයේදී වාණිජ්‍ය විෂය ධාරාව සඳහා සිසුන් 119,093 ක් බඳවා ගෙන තිබූ අතර 2015 වර්ෂයේදී වාණිජ්‍ය විෂය ධාරාව සඳහා සිසුන් 117,238 ක් බඳවා ගෙන තිබුණි.

(ඈ) විභාග දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව අනුව, 2015 වර්ෂයේදී පැවති අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි පාසැල් අයදුම්කරුවන් 210,340 ක් අතුරින් සියයට 8.64 ක් වන පාසැල් අයදුම්කරුවන් 18,183 ක් සියලු විෂය ධාරාවල සෑම විෂයයක්ම අසමත් වී තිබූ අතර සියයට 2.83 ක් වන පාසැල් අයදුම්කරුවන් 5,930 ක් විසින් සෑම විෂයයක් සඳහාම “ඒ” සමාර්ථ ලබා ගෙන තිබුණි. තවද, විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීමේ ඉහළ ප්‍රතිශතය වාර්තා කර තිබුණේ වාණිජ්‍යය විෂය ධාරාවෙන් අධ්‍යයන කටයුතු කළ සියයට 70.38 ක් වූ පාසැල් අයදුම්කරුවන් වූ අතර භෞතික විද්‍යා විෂය ධාරාවේ හා ජීව විද්‍යා විෂය ධාරාවේ පාසැල් අයදුම්කරුවන්ගෙන් පිළිවෙලින් සියයට 51.65 ක් හා සියයට 48.03 ක් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ගෙන තිබුණි. ශ්‍රී ලංකාවේ පළමු වරට 2015 වර්ෂයේදී පැවති අ.පො.ස. (උසස් පෙළ) සඳහා පෙනී සිටි ඉංජිනේරු තාක්ෂණ විෂය ධාරාව හා ජීව විද්‍යා තාක්ෂණ විෂය ධාරාවෙන් අධ්‍යයන කටයුතු කළ පාසැල් අයදුම්කරුවන් පිළිවෙලින් සියයට 50.09 ක හා සියයට 60.66 ක සාමාර්ථයන් වාර්තා කර තිබුණු අතර පාසැල් අයදුම්කරුවන් 11 දෙනෙක් පමණක් සෑම විෂයයක් සඳහාම “ඒ” සාමාර්ථයන් ලබා ගෙන තිබුණි.

(ඉ) දීප ව්‍යාප්තව පාසැල්වල තාක්ෂණ විද්‍යා විෂය ධාරාව සඳහා ගුරුවරු හිඟයක් පැවති බව නිරීක්ෂණය විය. ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2015 දෙසැම්බර් 31 දිනට තාක්ෂණ විෂය ධාරා සඳහා ගුරුවරු 660 ක පුරප්පාඩු පැවතුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැඩසටහනේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, වැඩසටහන විසින් තාක්ෂණික පීඨ 250 ක් සඳහා ගොඩනැගිලි ඉදිකිරීමට අපේක්ෂා කර තිබුණි. එයින් පීඨ 195 ක් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර 2015 දෙසැම්බර් 31 දිනට පීඨ 86 ක් සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා විවෘත කර තිබුණි. තවද, කොළඹ හා කළුතර දිස්ත්‍රික්කවල ඉදිකිරීමට යෝජිත මහින්දෝදය තාක්ෂණික පීඨ ගොඩනැගිලි 35 අතුරින්, 2015 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි 17 ක ඉදිකිරීම් කටයුතු පමණක් අවසන් කර තිබුණු අතර පීඨ 12 ක් සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා විවෘත කර තිබුණි. කොළඹ හා කළුතර දිස්ත්‍රික්කවල ජාතික පාසැල් 06 ක 2015 මාර්තු මාසයේදී විගණකවරුන් විසින් සිදු කළ ස්ථානීය පරීක්ෂණයන්හිදී බස්නාහිර පළාතේ හංවැල්ල මධ්‍ය මහ විද්‍යාලය, හෝමාගම මධ්‍ය මහ විද්‍යාලය, හොරණ තක්ෂිලා මහ විද්‍යාලය, වෑතර මහ විද්‍යාලය, වැව්ට මහා විද්‍යාලය හා පැලන්නෝරුව මහ විද්‍යාලවල මහින්දෝදය තාක්ෂණික පීඨ ගොඩනැගිලි බිත්තිවල ඉරිතැලීම් කිහිපයක් දක්නට තිබුණි. එමනිසා ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතුවල ගුණාත්මකභාවය සහතිකවීමේ යාන්ත්‍රණයන් අනුගමනය කර නොතිබූ බව තහවුරු විය.

(ආ) පරිචයක් ලෙස, වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘතිය ප්‍රමාදයන් සහිතව කටයුතු ආරම්භ කරයි. වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුව, මහින්දෝදය තාක්ෂණික පීඨ සඳහා කෘෂිකාර්මික උපකරණ හා ආහාර සැකසුම් උපකරණ ප්‍රසම්පාදනය කිරීම සඳහා කොන්ත්‍රාත් 2015 මාර්තු 18 දින ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් අදාළ කොන්ත්‍රාත් පිරිනමා තිබුණේ 2016 පෙබරවාරි 15 දිනදීය. තවද, 2015 මාර්තු 18 ට පෙර පිරිනැමීමට අපේක්ෂිත තාක්ෂණික පීඨ සඳහා ගෘහ භාණ්ඩ ප්‍රසම්පාදනය කිරීමේ කොන්ත්‍රාත් 2015 අගෝස්තු 20 දින පිරිනමා තිබුණු අතර කොන්ත්‍රාත් විෂයයන්වලින් සියයට 18 ක් පමණක් 2015 දෙසැම්බර් 31 දිනට සපයා තිබුණි. එයට අමතරව තාක්ෂණික විෂයධාරා සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා යෝජිත මෝටර් යාන්ත්‍රික උපකරණ ප්‍රසම්පාදනයන් පසුව අවලංගු කර තිබුණි.

(ඇ) මහින්දෝදය තාක්ෂණික පීඨවල ප්‍රයෝජනය සඳහා යාන්ත්‍රික, සිවිල් සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු උපකරණ හා ආම්පන්න ප්‍රසම්පාදනයට ව්‍යාපෘතිය 2014 වර්ෂයේදී කටයුතු කර තිබුණු අතර පැකේජ 07 ක් යටතේ රු. මිලියන 1,697.64 ක පිරිවැයකට විෂයයන් 166 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පැකේජ වශයෙන් ඇගයීම් කිරීම වෙනුවට විෂයයන් වශයෙන් ලංසු ඇගයීම සිදු කළේ නම් කොන්ත්‍රාත්තුව වඩා අඩු මිලකට පිරිනැමීමට හැකිව තිබුණු බව නිරීක්ෂණය විය. විෂයයන් වශයෙන් ලංසු ඇගයීම සිදු කළේ නම් උපකරණ හා මෙවලම් රු. මිලියන 55.73 කට ප්‍රසම්පාදනය කළ හැකිව තිබූ බව පැකේජ 07 අතුරින් පැකේජ 02 ක් පිළිබඳව සිදු කළ නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය. කෙසේ වෙතත් එම උපකරණ හා මෙවලම් රු. මිලියන 66.52 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කර තිබුණි.

(ii) ප්‍රසම්පාදනය කිරීමට අපේක්ෂිත විෂයයන් 166 ක් අතුරින් මහින්දෝදය තාක්ෂණික පීඨවල ප්‍රයෝජනය සඳහා අවශ්‍ය රු. මිලියන 373.44 ක් වටිනා විෂයයන් 71 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රසම්පාදනය කර තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ තරඟකාරී බව හා ප්‍රසම්පාදනය කළ විෂයයන්වල ආර්ථික බව තහවුරු කර ගැනීමට හැකිවන ආකාරයෙන් ලංසු කැඳවන අවස්ථාවේදී ප්‍රසම්පාදනය කිරීමට නියමිත විෂයයන්වල අවශ්‍යතාවය නිශ්චය කරගෙන නොතිබූ බව එයින් පෙන්නුම් කෙරුණි.

(iii) වැඩසටහනේ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා ඉදිරිපත් කළ වාර්තා අනුව, තාක්ෂණික පීඨ 250 ක් සඳහා උපකරණ හා මෙවලම් ප්‍රසම්පාදනය කර අදාළ පීඨ වෙත බාර දී තිබුණද 2015 දෙසැම්බර් 31 දිනට මහින්දෝදය තාක්ෂණික පීඨ 86 ක් පමණක් සපයන ලද විෂයයන් අදාළ කාර්යයන් සඳහා භාවිතා කර තිබූ බව නිරීක්ෂණය විය.